සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2024 අප්‍රේල් 25 |

# ශ්‍රී ලංකා මහ බැංකුව සිය පළමු *වාර්ෂික ආර්ථික විවරණය - 2023* හා *මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් - 2023* ප්‍රකාශයට පත් කරයි

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 80 වැනි වගන්තිය යටතේ පළමු ප්‍රකාශනය වන *වාර්ෂික ආර්ථික විවරණය 2023*, සහ ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 99 වැනි වගන්තිය යටතේ පළමු ප්‍රකාශනය වන *මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2023,* ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා විසින් ගරු ජනාධිපති සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත අද දින (2024 අප්‍රේල් 25) පිළිගන්වන ලදී.



[ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා විසින් වාර්ෂික ආර්ථික විවරණය 2023 සහ මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් 2023 යන ප්‍රකාශන ගරු ජනාධිපති සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත පිළිගැන්වීම. භාණ්ඩාගාර ලේකම් කේ. එම්. එම්. සිරිවර්ධන මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිනි ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මිය, නියෝජ්‍ය අධිපතිනි කේ. එම්. ඒ. එන්. දවුලගල මිය, සහකාර අධිපති ආචාර්ය සී. අමරසේකර මහතා, ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂිකා ආචාර්ය එස්. ජෙගජීවන් මිය, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ අධ්‍යක්ෂිකා ඩබ්. එල්. එස්. ඩබ්. ජයසුන්දර මිය සහ ආර්ථික පර්යේෂණ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එල්. ආර්. සී. පත්බේරිය මහතා ද මෙම අවස්ථාවට සහභාගී වූහ.]

**වාර්ෂික ආර්ථික විවරණය** පරිච්ඡේද තුනකින් සමන්විත වේ: 1 වන පරිච්ඡේදය මගින් සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ; 2 වන පරිච්ඡේදය මගින් මුදල් ප්‍රතිපත්ති රාමුව, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග, විදේශීය අංශයේ ප්‍රතිපත්ති සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් වන පරිදි මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කෙරේ; 3 වන පරිච්ඡේදය මගින් ගෝලීය ආර්ථික පරිසරය සහ දේශීය ආර්ථිකය ඇතුළත් සාර්ව ආර්ථික ඉදිරි දැක්ම ඉදිරිපත් කෙරේ. තවද, වාර්ෂික ආර්ථික විවරණයෙහි කාලීනව වැදගත් මාතෘකා යටතේ විශේෂ සටහන් හතක් අඩංගු වන අතර, මහ බැංකුව විසින් හා ඊට අදාළව ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ විශේෂාංග සටහනක් ද ඇතුළත් වේ. පසුගිය වසර 5 සිට 10 දක්වා තෝරාගත් වාර්ෂික දත්ත සහිත සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයක් සහ 1970 වසරේ සිට තෝරාගත් වාර්ෂික දත්ත සහිත සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයක් ද මෙම වාර්තාවේ ඇතුළත් වේ. මුද්‍රිත වාර්තාවට අමතරව, වැඩිදුර ඓතිහාසික දත්ත ද අන්තර්ගත, සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයේ (සංඛ්‍යා සටහන් 142ක්) සහ විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයේ (සංඛ්‍යා සටහන් 11ක්) මාර්ගගත සංස්කරණය භාෂා ත්‍රිත්වයෙන් Excel පැතුරුම්පත් ආකෘති මගින් ද ප්‍රකාශයට පත් කර ඇත (QR කේත සහ සංඛ්‍යා සටහන් සඳහා ප්‍රවේශ වන සබැඳි වාර්ෂික ආර්ථික විවරණයේ මුද්‍රිත වාර්තාවේ දක්වා ඇත).

**මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්** ප්‍රකාශනය කොටස් පහකින් සමන්විත වේ: 1 වන කොටසෙහි මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විස්තර දැක්වෙන අතර එහි සංක්ෂිප්ත මූල්‍ය විවරණයක්, විගණකාධිපති වාර්තාව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඇතුළත් ය; 2 වන කොටසෙහි දේශීය මිල ස්ථායීතාව පවත්වා ගෙන යෑම, මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම, සියලු දෙනාටම ප්‍රතිලාභ හිමි දියුණු මූල්‍ය පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම, ව්‍යවහාර මුදල් මෙහෙයුම් කළමනාකරණය, ජාත්‍යන්තර කටයුතු, නියෝජිත කාර්යයන් සහ මහ බැංකුවට පැවරී ඇති වෙනත් වගකීම් යනාදිය ආවරණය කරමින්, 2023 වසරේ දී මහ බැංකුව සිදු කළ මෙහෙයුම් ඇතුළත් ය; 3 වන කොටසින් අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව, අභ්‍යන්තර විගණනය, මානව ප්‍රාග්ධනය සහ පරිපාලනය ඇතුළු මහ බැංකුවේ අභ්‍යන්තර කළමනාකරණ කටයුතු පැහැදිලි කෙරේ; 4 වන කොටසෙහි පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයන්, පාලක මණ්ඩල අනු කමිටු, ප්‍රධාන විධායක නිලධාරීන් සහ මහ බැංකුවේ වෙනත් කමිටු පිළිබඳ විස්තර ඇතුළත් ය; 5 වන කොටසින් මහ බැංකුව මගින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන ආයතනවල තොරතුරු, මහ බැංකුවේ ප්‍රකාශන සහ දත්ත බෙදා හැරීම, ප්‍රාදේශීය කාර්යාල සහ ආයතනික තොරතුරු ඉදිරිපත් කර ඇත.

**වාර්ෂික ආර්ථික විවරණයෙන් පිළිබිඹු වන පරිදි 2023 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.**

නිදහසෙන් පසු ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික පසුබෑමෙන් අනතුරුව 2023 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. ආර්ථිකයේ පාර්ශ්වකරුවන් කෙටි කාලීනව දුෂ්කරතාවලට මුහුණ දුන්න ද, රජය සහ මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද තීරණාත්මක ප්‍රතිපත්ති ගැළපුම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් සාර්ව ආර්ථික ස්ථායීතාව යළිත් බොහෝ දුරට ස්ථාපිත කිරීම සඳහා සහාය සැපයිණි. ආර්ථික අර්බුදය තවදුරටත් තීව්‍ර වීම වළක්වාලීමට සහ යථා තත්ත්වයට පත්වීමේ තිරසාර මාවතක් ඔස්සේ ආර්ථිකය හැසිරවීම සඳහා මෙම ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය විය. විවිධ අවදානම්

රුසක් පවතින වාතාවරණයක් තුළ, ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සහ ණය තිරසාරත්වය යළි අත්කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ කැපවීම සමඟ පුළුල් මහජන පිළිගැනීමක් පැවතීම අත්‍යවශ්‍ය වේ.

ආර්ථික ගැළපුම් ක්‍රියාවලිය 2023 වසර තුළ දී ම යහපත් ප්‍රතිඵල අත්කරගෙන ඇත. 2022 වසරේ දී වාර්තා වූ ඉහළම උද්ධමන මට්ටම්වල සිට, 2023 වසර අවසානය වනවිට උද්ධමනය තනි ඉලක්කමක මට්ටමට පාලනය වී ඇති අතර, එමගින් මුදල් ප්‍රතිපත්තිය සාමාන්‍යකරණය කිරීමට අවස්ථාව සැලසිණි. ඒ අනුව, කාර්තු හයක් මුළුල්ලේ අඛණ්ඩව පැවති දීර්ඝතම ආර්ථික සංකෝචනයෙන් අනතුරුව, 2023 වසරේ දෙවන භාගය තුළ දී ආර්ථිකය ප්‍රසාරණයක් වාර්තා කළේය. ආර්ථික අර්බුදයෙහි මූලය වූ දිගු කාලයක් මුළුල්ලේ පවතින සමස්ත රාජ්‍ය අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය යන ද්විත්ව හිඟය 2023 වසරේ දී නිවැරදි වීමේ ලක්ෂණ පෙන්නුම් කළේය. එම වසරේ දී රජයේ ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් වාර්තා වූ අතර, විදේශීය ජංගම ගිණුමෙහි ද අතිරික්තයක් වාර්තා විය. අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ දී සම්පූර්ණයෙන් ම පාහේ පිරිහීමට ලක් වූ විදේශීය ස්වාරක්ෂක වසර තුළ දී ක්‍රමයෙන් නැවත වර්ධනය විය. අඩු ආනයන ඉල්ලුම මධ්‍යයේ, සංචාරක සහ අනෙකුත් සේවා අපනයන අංශයෙන් ලද ඉපයීම් මෙන්ම සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ද සමඟ විදේශ විනිමය ප්‍රවාහ වැඩි දියුණු වීම, අර්බුදය සමයේ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා සීමිත වීමේ ගැටලුවෙන් මිදීම සඳහා සහාය විය. මහ බැංකුව විසින් විදේශ විනිමය ශුද්ධ පදනමින් මිලදී ගැනීම සහ බහුපාර්ශ්වික හවුල්කාර ආයතනවලින් ලද මූල්‍යන පහසුකම් මගින් දළ නිල සංචිත වර්ධනය කරගැනීම සඳහා සහාය ලැබුණි. මෙම ප්‍රවණතා සහ වැඩි දියුණු වූ වෙළඳපොළ විශ්වාසයත් සමඟ 2023 සහ 2024 වසරේ මුල් කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් විය. රජයේ විදේශීය ණය කළඹ ප්‍රතිව්‍යුහගත කිරීමේ සාමූහික ප්‍රයත්නය තුළින් එම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමත් සමඟ රට තිරසාර ලෙස යථා තත්ත්වයට පත්වීම සඳහා අවශ්‍ය ඉඩකඩ සැලසෙනු ඇත. මේ අතර, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය අවසන් කිරීමත් සමඟ රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතිකවලට අදාළ අවදානම් අධිමිල පහළ යෑම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික සැලකියයුතු ලෙස පහළ ගියේය. වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ මෙම පහළ යෑම සහ වැඩි දියුණු වූ වෙළඳපොළ අපේක්ෂා හේතුවෙන් 2023 වසරේ ජූනි මාසයේ සිට පෞද්ගලික අංශයට ලබාදෙන ණයෙහි සංකෝචනය වීමේ ප්‍රවණතාව වෙනස් විය. මේ අතර, මහ බැංකුවේ පූර්වෝපායික සහ විචක්ෂණශීලී ප්‍රතිපත්ති සහාය මෙන්ම මූල්‍ය ආයතනවල අර්බුද සඳහා ඉහළ පෙර සූදානම තුළින් මූල්‍ය අංශය එහි ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු කළේය.


ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රශස්ත ක්‍රමවේද වෙත යොමු වෙමින් සහ ලද අත්දැකීම් භාවිතයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය ප්‍රතිනිර්වචනය කරමින්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී බලාත්මක කෙරිණි. මෙමගින්, මහ බැංකුවේ ස්වාධීනත්වය සහ පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත මහ බැංකුවේ ඇති වගවීම වැඩි දියුණු කිරීමේ මග තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් සලකුණු කෙරිණි. මූලිකව ආර්ථිකයේ ස්ථාවරත්වයක් ඇති කිරීම සහ ඉන් අනතුරුව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය දැක්වීමට මහ බැංකුව විසින් 2023 වසර තුළ දී ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාවට නංවන ලදී. 2023 වසරේ ජූනි මාසයේ සිට දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක සිට ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් වෙත මාරු වීම, විනිමය අනුපාතය තීරණය වීමේ දී ඉහළ නම්‍යශීලීත්වයක් සඳහා ඉඩ හැරීම මෙන්ම ඇතැම් විදේශ විනිමය ගනුදෙනු මත පනවා තිබූ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීම යනාදී ක්‍රියාමාර්ග ඊට ඇතුළත් විය. විචක්ෂණශීලී නියාමන

ක්‍රියාමාර්ග පිළිබඳව මහ බැංකුව මූල්‍ය අංශය වෙත මාර්ගෝපදේශ සැපයූ අතර, එමගින් දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කෙරිණි. මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ, මූල්‍ය ආයතනවල අධීක්ෂණ අධිකාරිය ලෙස මෙන්ම නිරාකරණ අධිකාරිය ලෙස මහ බැංකුවේ භූමිකාව ශක්තිමත් කිරීමට අමතරව, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ මහ බැංකුවේ කාර්යයභාරය ශක්තිමත් වූ අතර, මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීමට අදාළව එහි දායකත්වය පිළිබඳව ද පිළිගැනීමක් හිමිවිය. මේ අතර, බැංකු සහ බැංකු නොවන මූල්‍ය අංශයේ සුරක්ෂිතතාව හා යහපැවැත්ම ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාවට නැංවිණි. එසේම, ආර්ථිකය තුළ ඩිජිටල් ගෙවීම් පද්ධති සංවර්ධනය කිරීම සඳහා වන සිය ප්‍රයත්න අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව කටයුතු කළ අතර, එමගින් මහජනතාව භාවිතා කරන ගෙවීම් ක්‍රමවල කාර්යක්ෂමතාව මෙන්ම ඒ සඳහා වන ප්‍රවේශය ද වැඩිදියුණු කිරීමට සහාය සැලසෙනු ඇත.


ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (ජා. මූ. අරමුදල) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යෑමෙහි සහාය ඇතිව, 2023 වසරේ අවසාන භාගය තුළ දී දක්නට ලද ආර්ථික ප්‍රගතිය ඉදිරි වසරවල දී ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ සියලුම ක්ෂේත්‍ර තුළ පුළුල් ආර්ථික වර්ධනයක් බලාපොරොත්තු වන අතර, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ ඉහළ ස්වාධීනත්වය හා වගවීම මෙන්ම මහ බැංකුව විසින් රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම තහනම් වීම හරහා දේශීය මිල ස්ථායීතාව ආරක්ෂාවනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශීය ස්වාරක්ෂක ගොඩ නැංවීම, විදේශ විනිමය ප්‍රවාහ සාමාන්‍යකරණය වීම සහ රජයේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වීමත් සමඟ විදේශීය අංශයේ ස්ථායීතාව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. නීති සංශෝධන සහ ඉහළ ඒකාබද්ධකරණය මගින් බලගැන්වුණු මූල්‍ය අංශය ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් යුතුව අත්‍යවශ්‍ය ආයතනික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාවට නංවන අතර, ආර්ථිකය තිරසාර මාවතක් කරා ගෙන යෑම තහවුරු කිරීම සඳහා රජය විසින් සිය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. කෙසේවෙතත්, මේ දක්වා ක්‍රියාවට නංවන ලද ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යෑම මත ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීම රඳා පවතින අතර, මෙම ක්‍රියාවලියෙහි ම කොටසක් ලෙස ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඉතා වැදගත් වේ. තවමත් රට මුළුමනින්ම ආර්ථික අර්බුදයෙන් මිදී නොමැති බැවින්, සැලසුම්ගත මාවතෙන් ඉවත් වීම සඳහා කිසිදු අවකාශයක් නොපවතී. මනාව සැලසුම් නොකළ ප්‍රතිපත්ති අත්හදා බැලීම්වල ව්‍යසනකාරී සමාජ ආර්ථික බලපෑම් මෑත කාලීන අත්දැකීම් මගින් සනාථ කර ඇත. තවද, ක්‍රියාවට නැංවූ සහ සැලසුම් කරන ලද තීරණාත්මක ප්‍රතිසංස්කරණ ආපසු හැරවීම ආර්ථිකය නැවතත් අස්ථායී තත්ත්වයකට ඇද දැමීමට හේතුවනු ඇත. එහෙයින්, ප්‍රතිපත්ති ආපසු හැරවීම හා ඒ හේතුවෙන් ඇතිවන ආර්ථික පසුබෑම් වළක්වා ගැනීම සඳහා පුළුල් දේශපාලනික සහ සමාජයීය එකඟතාවක් මත ආර්ථික ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අතිශයින් තීරණාත්මක වන අතර, තිරසාර වර්ධනයක් තුළින් පොදු ජනතාවගේ සුබසාධනය ඉහළ නැංවීම එමගින් සහතික කෙරෙනු ඇත.

# වාර්ෂික ආර්ථික විවරණය 2023 මගින් පිළිබිඹු වන පරිදි ශ්‍රී ලංකා ආර්ථිකය සංක්ෂිප්තයක් ලෙස


## උද්ධමනය සීඝ්‍ර නිර්-උද්ධමන ක්‍රියාවලියක් වාර්තා කළේය...





## මූර්ත ද.දේ.නි.යේ වර්ධනය ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත්වෙමින් පවතී...





## ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කරන ලදී...





## වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු විය...





## මුදල් ප්‍රසාරණය අඩු මට්ටමක පැවතිණි...





## 2023 වසරේ දෙවන භාගයේ දී පෞද්ගලික අංශයට ලබා දුන් ණය ඉහළ ගියේය...



## 2023 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්විය...








## 2023 වසරේ දී මූල්‍ය පද්ධතිය සමස්තයක් ලෙස ස්ථායීව පැවතිණි...





## තිරසාරභාවය උදෙසා වූ දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති...


**රාජ්‍ය ආදායම** (ද.දේ.නි.යෙහි % ලෙස)




**රාජ්‍ය වියදම** (ද.දේ.නි.යෙහි % ලෙස)





**ප්‍රාථමික ශේෂය සහ අයවැය ශේෂය** (ද.දේ.නි.යෙහි % ලෙස)




*ප්‍රාථමික ශේෂයෙන් පොලී වියදම අඩු කළ විට, සමස්ත අයවැය ශේෂයට සමාන වේ.

**මධ්‍යම රජයේ ණය** (ද.දේ.නි.යෙහි % ලෙස)




**ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි ප්‍රගතිය**

**2022 සැප්තැම්බර්**
නව විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන පිළිබඳව ජා.මූ. අරමුදල සමඟ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹීම

**2023 මාර්තු**
ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය සහ පළමු වාරිකය ලැබීම

**2023 ඔක්තෝබර්**
පළමු සමාලෝචනය සඳහා ජා.මූ. අරමුදල සමඟ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹීම

**2023 දෙසැම්බර්**
ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය සහ දෙවන වාරිකය ලැබීම

**2024 මාර්තු**
දෙවන සමාලෝචනය සඳහා ජා.මූ. අරමුදල සමඟ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹීම